**ශීර්ෂය 117- උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 12 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලින මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා අනුරූපී බව ප්‍රකාශ කළ නොහැක. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී එම වත්කම්වලට අදාළ ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම් සමඟ කේවල වත්කම් වටිනාකම් පරීක්ෂා කර නොතිබුණි. | 2018 නොවැම්බර් **21** දිනැති අංක **267/2018** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වත්කම්වලට අදාළ ප්‍රධාන ලෙජර් ශේෂ සමග කේවල ශේෂ සැසඳිය යුතු වීම. | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කල අංක 01/2017 දරණ වත්කම් චක්‍රලේඛය ප්‍රකාරව තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කොට ඇත. ඉඩම් ගොඩනැගිලි හා වාහන කේවල ශේෂයන් සිගාස් පද්ධතියේ ඇතුලත්ව තිබුණද විගණන පරීක්ෂාව සිදු කරන විට අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කොට නොතිබුණි. |
| (ආ) රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය පවත්වාගෙන යාම සඳහා රාජගිරිය ප්‍රදේශයේ කුලියට ගෙන ඇති ගොඩනැගිල්ල වෙනුවෙන් ඇප තැන්පත් ලෙස 2017 වර්ෂයේදී රු.1,710,000 ක් ගෙවා තිබුණි. එම මුදල, කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමෙහි හා කුලී වැඩ අත්තිකාරම් සංචිත ගිණුමෙහි පෙන්වා නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව බාහිර පාර්ශවයන් වෙත ගෙවා ඇති කුලී වැඩ අත්තිකාරම් අදාළ ආකෘතිපත්‍රවල ඇතුළත් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණය හා එකග වෙමි. රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 උපදෙස් ප්‍රකාරව ගොඩනැගිලි හිමියාට ගෙවා ඇති ඇප තැන්පතු මුදල ඉදිරියේදී මූල්‍ය වාර්ථාවල සටහන් කිරීම සඳහා පියවර ගනිමි. |

### 1.6.2 දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සිගාස් පරිගණක පද්ධතිය තුල ඇතුලත් කර ඇති දේපල පිරියත හා උපකරණවල අගය වූ රු. මිලියන 8,279.20 ක් | පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව ආයතනය සතුව හා ආයතන භාරයේ පවතින සියළුම දේපල පිරියත උපකරණ | 2018 වර්ෂයේ මහාමාර්ග අමාත්‍යාංශය නමට පවරා ගෙන ඇති රු.130,600,000 ක තක්සේරු වටිනාකම ඇති වාහන 12 ක් සිගාස් පරිගනක |

| | | |
|---|---|---|
| පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ඇතුලත් කර තිබීම හා පරිගණකගත පද්ධතිය තුලට ඇතුළත්වී නොමැති වත්කම් අමාත්‍යාංශය සතු වීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල මූල්‍ය නොවන වත්කම් නිවැරදිව නිරූපණය කර නොතිබුණි. | අයිතමයන්හි ධාරණ වටිනාකම හෝ ප්‍රත්‍යාගණිත වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ඇතුලත් කළ යුතු වීම. | පද්ධතිය තුලට ඇතුලත් කර නොතිබුණි. මාර්ග සංවර්ධන අධිකාරියට අයිති කාර්යාල උපකරණ අමාත්‍යංශය විසින් පරිහරණය කලද අයිතිය මේ වන තෙක් අමාත්‍යංශය වෙත පවරා ගෙන නොමැත. පැවරීම අවසන් වූ පසු සිගාස් පරිගණක පද්ධතියට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) දේපල පිරියත උපකරණ ගිණුමේ ආරම්භක ශේෂය හා පසුගිය වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය අතර රු. මිලියන 671.34 ක වෙනසක් නිරූපණය වීම හේතුවෙන් දේපල පිරියත උපකරණ උක්ත අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පොදු ජනලය තුල ගිණුම් සටහන් මඟින් නිවැරදිකිරීම් කර මූල්‍ය ප්‍රකාශන සටහනක් මඟින් හෙළිදරව් කිරීම් කළ යුතු වීම. | 2017 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සිගාස් වැඩසටහනේ වත්කම් සමඟ සැසඳීමක් කර නැති නමුත් 2018 මූල්‍ය වාර්තාවේ වත්කම් වටිනාකම නිවැරදිය. |

### 1.6.3 මූලධන වියදම්

-----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය සංවර්ධනය කිරීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වසර 06 කින් ගෙවා නිම කිරීමේ පදනම මත පෞද්ගලික වාණිජ බැංකු 02 කින් ලබාගෙන තිබූ රු.මිලියන 10,291.2 ක ණය මුදල මූල්‍ය ප්‍රකාශනවල සටහන් වශයෙන් හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අමාත්‍යාංශයේ සියළුම බැඳීම් හා වගකීම් සියල්ල එම මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියේදි මූල්‍ය ප්‍රකාශ සකස් කිරිමේදි මූල්‍ය ප්‍රකාශ වල සටහනක් ලෙස ණය මුදල් සම්බන්ධයෙන් හෙළිදරව් කිරිමට පියවර ගනිමි. |

### 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාන මාරු වීම්, සේවය අතහැර යාම හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අය කර ගෙන නොතිබූ රු.**683,637** ක හිඟ ශේෂයක් පැවති අතර, හිඟහිටි කාලය මාස 03 ක සිට වර්ෂ 28 ක් දක්වා පරාසයක විය. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කර හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ස්ථාන මාරු වී ගිය දැනට නිරවුල් නොවී පවතින ණය ශේෂ 03 ක් සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු සොයා ගැනීමට නොහැක. සේවය හැර ගොස් සිටින නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට නීතිමය කටයුතු කරමින් පවතී.<br>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති රු.175,594 ක් අයකිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් ලැබී ඇත. |

### 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ඇප ලේඛනය**<br>ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. |
| **(ආ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**<br>විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු | ඉදිරියේදී විදුලි උපකරණ ලේඛණයක් පවත්වා ගැනීමට උපදෙස් ලබා දීමට සටහන් කර ගනිමි. |

| | | |
|---|---|---|
| | ලේඛන පොතක් පවත්වා ගත යුතු වීම. | |
| **(ඇ) හානි පිළිබඳ ලේඛනය** | | |
| හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලින කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කල යුතුවීම. | පවත්වා ගෙන යනු ලබයි. යාවත්කාලීන කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| **(ඈ) බැරකම් පිළිබඳ ලේඛනය** | | |
| බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතු වීම. | බැරකම් ලේඛණයක් නඩත්තු කරන ලෙස සියළුම අංශ වෙත දැනටමත් උපදෙස් ලබා දී ඇති අතර ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යන්නේදැයි පසු විපරම් කිරීමට සටහන් කර ගතිමි. |

### 1.6.6 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **නිරීක්ෂණය** | **නිර්දේශය** | **අමාත්‍යාංශයේ අදහස් දැක්විම** |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතරම එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස පවත්වා ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු අතර, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. ඉදිරියේදි ජාතික විගණන පනත ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවට ත්‍රෛමාසිකව විගණන හා කළමණාකරන කමිටු රැස්වීමේදි සමාලෝචනය කිරීමටත් ඒ සම්බන්ධයෙන් විගණකාධිපති වෙත ලිඛිතව වාර්තා කිරීමටත් අවශ්‍ය පියවර ගනිමි. |

## 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 104(4) | වාහන අනතුරු පිළිබඳ පූර්ණ වාර්තාවක් අනතුර සිදුවී මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කල යුතු වුවත් වර්ෂය තුල සිදුවී තිබූ අනතුරු 02 ක් සම්බන්ධයෙන් එම වාර්තා 2019 ජුනි 12 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතු වීම. | මෙම තත්ත්වය මගහරවා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ඇත. |
| (ආ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02(ii) ඡේදය | අමාත්‍යාංශයට පවරා නොගත් වාහන 9 ක් සහ වෙනත් අමාත්‍යාංශයකට ලබාදුන් වාහනයක් සම්බන්ධව චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වෙනත් අමාත්‍යාංශ වෙතින් මෙම අමාත්‍යාංශය වෙත පවරාගෙන ඇති හෝ පවරා ගැනීමට කටයුතු කර ඇති වාහන 09ක් පමණක් ඇත. |
| (ඇ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ඉදිරිපත් කර තිබූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව අනාවරණය වී තිබූ භාණ්ඩ අයිතම 171 කට අදාළ ඌනතා හා භාණ්ඩ අයිතම 137 කට අදාළ අතිරික්තතා සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | ඌනතා සහ අතිරික්තතා පැන නැගි ඇත්තේ වංචාවක් අක්‍රමිකතාවක් අනිසි භාවිතයක් නිසා නොවේ. පොත්වල සටහන් කිරීම මග හැරීම හේතුවෙන් ඌනතා සහ අතිරික්තතා පැන නැගී තිබුණි. ඒවා සඳහා පොත්වල ගැලපුම් කිරීමට කටයුතු යොදා ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුල අමාත්‍යාංශය වෙත වෙන්කර තිබූ මුළු ප්‍රතිපාදනය වූ රු.මිලියන 212,471.29 ක ප්‍රතිපාදනවලින් සියයට 16 ක් වූ රු.මිලියන 33,950.13 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. පසුගිය වර්ෂ 5 ට අදාලව අමාත්‍යාංශය වෙත වෙන්කර තිබූ ප්‍රතිපාදනයන් හා එහි උපයෝජනය සැලකීමේදී ප්‍රතිපාදනයන් ඉතිරිවීම්වල ඉහලම අගය වාර්තාවී තිබුණේ ප්‍රවර්තන වර්ෂයේදීය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි ඇගයීමකින් හා ක්‍රමවත් අධ්‍යයනයකින් ඇස්තමේන්තු පිළියෙල කිරීමට ක්‍රියා කළ යුතු වීම. | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. |
| (ආ)අමාත්‍යාංශය වෙත වැය විෂයයන් 12 කට වෙන්කර තිබූ රු.මිලියන 744 ක් වන මුළු ප්‍රතිපාදන වටිනාකමින් කිසිදු ප්‍රතිපාදනයක් උපයෝජනය නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි. | -එම- | වැය විෂයයන් වලට අදාලව මූලික කටයුතු වර්ෂය තුලදී සම්පූර්ණ නොවීම හේතුවෙන් සහ අනෙක් ව්‍යාපෘති සඳහා අක් මුදල් නිදහස් නොවීම හේතුවෙන් මෙම ප්‍රතිපාදනය උපයෝජනය කිරීමට නොහැකි විය. |
| (ඇ) පරිපූරක ඇස්තමේන්තු මඟින් වැය විෂයයන් 6 කට අදාළව අනුමත කරවාගෙන තිබූ එකතු වටිනාකම රු. මිලියන 503.8 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරිවී තිබුණි. | -එම- | අයවැය යෝජනා ඉදිරිපත් වී තිබුනද ඒවායේ මූලික වැඩ කොටස් සම්පූර්ණ වී නොතිබීම අමාත්‍යාංශ විෂය පථය වරින් වර අවස්ථා හතරකදී වෙනස් වීම, විවිධ අමාත්‍යවරුන් පත් වීම හා ලේකම්වරුන් වෙනස් වීම වැනි හේතු නිසා මෙම ප්‍රතිපාදන උපයෝජනය සඳහා අවස්ථාවක් නොලැබුනි. |
| (ඈ) වැය විෂයයන් 15 ක් වෙනුවෙන් වෙන්කර තිබූ රු. මිලියන 3,174.5 ක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම වෙනත් වැය විෂයයන් වෙත මාරුකර තිබුණි. | නිවැරදිව හඳුනාගත් වියදම් අවශ්‍යතාවයන්ට පමණක් අයවැය ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන අතර මෙවැනි තත්ත්වයන් අවම කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ඉ) වැය විෂයයන් 57 කට | නිසි පුරෝකථනයකින් | විගණන නිරීක්ෂණය සමඟ |

| | | |
|---|---|---|
| සලසාගෙන තිබූ ප්‍රතිපාදන එකතුව රු.මිලියන 63,699.1 කින් රු.මිලියන 21,924.5 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර, එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි. | යුක්තව වැය ඇස්තමේන්තු සැකසිය යුතු වීම. | එකඟ වන අතර මෙවැනි තත්ත්වයන් අවම කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ඊ) වැය විෂයන් 14 කට අදාලව මූලික වියදම් ඇස්තමේන්තු හා සංශෝධන වියදම් ඇස්තමේන්තු අතර වෙනස රු. මිලියන 1,743 ක් වූ අතර එය සියයට 25 ක සිට සියයට 253 ක් දක්වා පරාසයක් විය. | මූලික වැය ඇස්තමේන්තු නිවැරදිව හා තාත්විකව පිළියෙළ කිරීමට කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂය වෙනුවෙන් සැලසුම් කළ ඇස්තමේන්තු ප්‍රතිපාදන තුල අමාත්‍යාංශයේ කටයුතු කළමනාකරණය කර ගැනීම අසීරු විය. අත්‍යාවශ්‍ය වියදම් දැරිය යුතු අවස්ථාවන්වලදි පමණක් වියදම් දැරිම සඳහා වියදම් ඇස්තමේන්තු සංශෝධනය කරන ලදී. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) බැරකම් ලේඛන නිතිපතා පරීක්ෂා කොට නිරවුල් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට නොපියවූ බැරකම් හා බැඳීම්වල එකතුව රු.මිලියන 87,172.35 ක් විය. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | බැරකම් ලේඛන පරීක්ෂා කොට නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (ආ)වාර්ෂික අයවැය සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර නොගත යුතු වුවත් අමාත්‍යාංශය විසින් වැය විෂයයන් **65** ක් වෙනුවෙන් මුළු ප්‍රතිපාදනය ඉක්මවා රු.මිලියන 59,667 ක බැරකම්වලට බැඳී තිබුණි. | 2017 අප්‍රේල් 21 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රතිපාදන සීමාව තුළ වියදම් දැරීමට කටයුතු කළ යුතු වීම. | මහාමාර්ග අමාත්‍යාංශයේ වාර්ෂික ඇස්තමේන්තුව සීමා වීම තුල ව්‍යාපාතියේ අපේක්ෂිත ඉලක්ක ගත නිමකිරීම් සීමා කිරීම කල නොහැකිය. එසේම කොන්ත්‍රාත්කරුවන්ගේ බිල් ප්‍රමාද කිරීම නිසා දේශිය හෝ විදේශීය පොළී ගෙවීමට සිදුවේ. එයින් ව්‍යාපෘතියේ පිරිවැය ඉහල යාම සිදුව තිබූ අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මුළු බැරකම් වූ රු මිලියන 216 ක මුදල අදාල වන්නේ කඩිනම් නේවාසිකාගාර |

| | | |
|---|---|---|
| | | ඉදිකිරීම් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිකිරීම් කටයුතු සිදු කර බිල් පත් ඉදිරිපත් කර තිබුණද ප්‍රතිපාදන අවසන් වී තිබීමයි. |

## 2.3 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කිරීමේදී අය කරනු ලබන තැන්පත් මුදල් එම උසස් අධ්‍යාපන ආයතන නියාමනය සඳහා උපයෝජනය කළ යුතුයි. එසේවුවද එම ආයතන 42 කින් 2015, 2016 සහ 2017 වර්ෂවල අයකර ගෙන තිබූ එකතුව රු.24,720,487 ක් වූ තැන්පත් මුදල් කිසිදු නියාමන කටයුත්තක් සඳහා යොදා ගෙන නොතිබුණි. | අය කර ගනු ලබන තැන්පතු මුදල් කාල පමාවකින් තොරව අදාළ පාඨමාලා නියාමන කටයුතු සඳහා උපයෝජනය කළ යුතු වීම. | රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයේ සමාලෝචන කාර්යය සඳහා සහභාගී වීමට කැමැත්ත දැක්වූ විෂය ක්ෂේත්‍ර ප්‍රවීණයන් සංචිතයක් ඇති කිරීම, විවිධ විෂය කේෂ්ත්‍ර වල ප්‍රවීණයන් 57 දෙනෙකු දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම, උපාධි ප්‍රධාන ආයතන ලෙස පිළිගැනීම සිදුකරන ලද සහ අයදුම් කරන ලද ආයතනයන්හි ප්‍රධානීන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම, ආයතන සමාලෝචන කාර්යය සඳහා අවම ප්‍රමිතීන් නිර්ණය කිරීම සඳහා කමිටු පත් කිරීම සහ විදේශ සිසුන්ට වීසා ලබා දීම සඳහා පොදු ප්‍රතිපත්තියක් සැකසීම, යනාදී කාර්යයන් 2018/2019 වර්ෂයන්ට අදාළව ඉටුකර ඇත. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර තිබූ ඉදිරි වර්ෂ 02 ක් හෝ වර්ෂ 03 ක් ඇතුළත ක්‍රියාවට නැංවීමට සැලසුම් කළ ක්‍රියාකාරකම් | අදාළ වර්ෂය තුළදී ඉටුකිරීමට යෝජිත කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුවීම. | 2017 වසරට පෙර තිබූ උපායමාර්ගික සැලසුමෙහි සඳහන්ව තිබූ ඉදිරි වසර සඳහා වන ඉලක්කයන් 2017 වසරේදී එම සැලසුමෙන් වෙනස් විය. ඒ සඳහා හේතු වූයේ සමස්ථ විශ්ව විද්‍යාල |

| | | |
|---|---|---|
| 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | | පද්ධතිය තුල සිදු කරන ලද සාකච්ඡාවන්, සමාලෝචනයන් හරහා එම අදහස් හා යෝජනා මත පදනම්ව ඇතැම් කොටස් සංශෝධනය කල යුතු බව හැගී යාමයි. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 වර්ෂයට අදාළව පිළියෙල කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය විසින් ඉලක්ක 3 ක් යටතේ අරමුණු 07 කට අදාළ ක්‍රියාකාරකම් ඉටුකර ගැනීම සඳහා ව්‍යාපෘති 25 ක් යටතේ රු. මිලියන 11,662.1 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) පළමු ඉලක්කය යටතේ 2016 වර්ෂයේ ආරම්භ කොට 2019 වර්ෂයේදී අවසන් කිරීමට නැගෙනහිර විශ්වවිද්‍යාලය සඳහා සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨ ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. එසේවුවද, සමාලෝචිත වර්ෂයේදී මේ වෙනුවෙන් රු.මිලියන 288.5 ක මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණ ද සත්‍ය වශයෙන් වියදම් කර තිබුණේ රු.මිලියන 31.3 ක් පමණි. සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 10 ක් සහ භෞතික ප්‍රගතිය සියයට 14 ක් වැනි පහළමට්ටමක පැවතුණි. | ක්‍රියාකාරි සැලැස්මේ අනුගත වූ ඉලක්ක අදාළ කාලසීමාව තුළ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | උපදේශන ආයතනය තෝරා ගැනීමේ ක්‍රමවේදයෙහි කරන ලද වෙනස්කම් මත සැලසුම් කළ දින ගණනට වඩා දින 156 ක් ගතවීම, නැගෙනහිර විශ්වවිද්‍යාලය සැලසුම් විවිධ අවස්ථාවලදී වෙනස්කිරීම මත වැඩිපුර කාලයක් ගතවීම, කොන්ත්‍රාත්තුව ප්‍රදානයකිරීම ප්‍රමාදවීම, සේවක සංඛ්‍යාව අනුමත කිරීම ප්‍රමාදවීම, අත්තිකාරම් මුදල් ගෙවීමටවත් ප්‍රමාණවත් ලෙස ප්‍රතිපාදන නොලැබීම යනාදී කරුණු මත අවශ්‍ය පරිදි කාර්යසාධනය ලඟා කර ගැනීමට බාධා වී තිබුණි. |
| (ii) දෙවන ඉලක්කය යටතේ පාඨමාලාවල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම්වලදී ඉහළ තලයකට ගෙන ඒමට හැකිවන | ශ්‍රී ලංකාව ආසියාවෙහි උසස් අධ්‍යාපන කේන්ද්‍රය බවට පත්කිරීමේ දැක්මක් සහිතව |

| | | |
|---|---|---|
| පාදක කරගෙන විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව අවම වශයෙන් රාජ්‍ය විශ්වවිද්‍යාල හා රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල 03 ක් මුල් 1,000 අතරට ද, විශ්වවිද්‍යාල 06 ක් මුල් 2,000 අතරට හා ඉතිරි විශ්වවිද්‍යාල මුල් 5,000 අතරට ගෙන ඒමට කටයුතු කිරීම අරමුණ වී තිබුණි. එසේවුවද, 2018 වර්ෂය අවසානයේදී එක් රාජ්‍ය විශ්වවිද්‍යාලයක්වත් මුල් 1000 අතරට ලඟා වී නොතිබූ අතර, එක් විශ්වවිද්‍යාලයක් පමණක් මුල් 2000 අතරට ලඟාවී තිබුණි. තවද, විශ්වවිද්‍යාල 08 ක් 2000 - 5000 අතර සීමාවේද, ඉතිරි විශ්වවිද්‍යාලයක 10 ක් 5000 සීමාව ඉක්මවා ශ්‍රේණිගත වී තිබුණි. | අයුරින් පාඨමාලාවල ගුණත්වය වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවීම. | කටයුතු කල බැවින් ඒ සඳහා භාවිතා කල හැකි දර්ශකයන් සඳහා යෙදිය යුතු අධික පිරිවැය හේතුවෙන්, කිසිදු පිරිවැයක් නොමැති එහෙත් ජාත්‍යන්තර ලෙස අවම වශයෙන් හෝ පිළිගැනීමක් සහිත "Webometrics" දර්ශකය භාවිතා කිරීමට තීරණය විය. හඳුන්වාදුන් වසරේ සිට වසර කිහිපයක් තුල විශ්වවිද්‍යාල අතර තරගකාරීභාවයක් ඇතිවීම හා තම ස්ථානය ඉහලට ගෙන ඒම සඳහා අවශ්‍ය උපක්‍රමයන් භාවිතා කිරීමට පෙළඹීම, මුල් වකවානුවෙහි ප්‍රතිඵලදායී ලෙස ස්ථානයන් වෙනස් වීම, දර්ශකය භාවිතය සඳහා පිරිවැයක් දැරීමට සිදු නොවීම, ශ්‍රී ලංකාවෙහි විශ්වවිද්‍යාලයන් ශ්‍රේණිගතව ඇති රටාවන් සහ ඒවා අතර පරතරයන් හඳුනා ගැනීමට හැකිවීම, යනාදී ප්‍රතිලාභයන් ලැබුණි. |
| (iii) 2014 වර්ෂයේදී සියයට 59 ක් ලෙස පැවති උපාධිධාරී රැකියා නියුක්තිභාවය 2020 වර්ෂයේ සියයට 70 දක්වා වැඩි කිරීමට සැලසුම් සකස් කර තිබුණ ද එම ඉලක්කවලට අදාළ කාර්යසාධන මට්ටම් හඳුනා ගැනීමට අදාළ නිර්ණායකයන් අමාත්‍යාංශය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කර නොතිබුණි. | විශ්වවිද්‍යාලවලින් උපාධි ලබා පිටවන උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය වැඩිකිරීමට අදාළ උපායමාර්ග හඳුන්වාදීමත්, රැකියා නියුක්තිභාවයට අදාළ කාර්යසාධනය මැන බැලීම සඳහා නිර්ණායකයන් හඳුන්වාදීමටත් කටයුතු කළ යුතුවීම. | උපාධිධාරී රැකියා නියුක්තභාවය ගණනය කිරීම HETC ව්‍යාපෘතිය මගින් සැලසුම් කර, ප්‍රතිපාදන ලබා දී එක් එක් විශ්වවිද්‍යාලය මගින් සිදු කරන ලදී. එහෙත් ව්‍යාපෘතිය අවසන් වූ පසු එම ක්‍රියාවලිය එක් එක් විශ්වවිද්‍යාල විසින් වෙන වෙනම සිදු කල යුතුව තිබුණද කල් වේලා සහිතව ප්‍රතිපාදන වෙන් කර නොගැනීම, යාන්ත්‍රණයක් නොතිබීම, අවම වශයෙන් බොහෝ විශ්වවිද්‍යාලයන් සඳහා සංඛ්‍යා ලේඛන නිලධාරියෙකුවත් නොසිටීම වැනි කරුණු මත පදනම්ව එම ක්‍රමවේදය ඉදිරියට ක්‍රියාත්මක වී නැත. |

| | | |
|---|---|---|
| (ආ) 2017 වර්ෂයේදී ආරම්භ කර 2020 වර්ෂයේ නිමකිරීමට සැලසුම් කර ඇති රුහුණු විශ්වවිද්‍යාලයේ තට්ටු 8 කින් සමන්විත ගොඩනැගිල්ල සඳහා වර්ෂය තුල රු.මිලියන 500 ක් ප්‍රතිපාදනය කර තිබුණි. ඉන් රු.මිලියන 269.3 ක් උපයෝජනය කර තිබුණද භෞතික ප්‍රගතිය සියයට 19 ක් වී තිබුණි. කොන්ත්‍රාත්කරුවන්ගේ ඉදිකිරීම් හැකියාව පිළිබඳ ඇගයීමකින් තොරව කටයුතු කිරීම ඒ සඳහා හේතුවී තිබුණි. | ව්‍යාපෘති ආරම්භයේ සිට අවසානය දක්වා වූ කාලරාමුවට අනුකූල අයුරින් මූල්‍ය තත්ත්වය කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතුවීම. | මෙම ව්‍යාපෘතිය සඳහා මුල් ඇස්තමේන්තු වලින් වෙන් කර තිබුනේ රු මිලියන 300ක ප්‍රතිපාදන ප්‍රමාණයකි. නමුත් 2017 වර්ෂ අවසානයේදි අක්මුදල් නොමැති වීම හේතුවෙන් ගෙවීමට නොහැකි වු බිල්පත් සඳහා රු. මිලියන 200 ක අතිරේක ප්‍රතිපාදනයක් සලසා දෙන ලදි. ඒ අනුව එම රු මිලියන 500 ක ප්‍රතිපාදනය භාවිතා කර රු. මිලියන 200 ක වැඩ අත්තිකාරම් මුදලක් සහ රු මිලියන 69.3ක අන්තර් බිල්පත් ගෙවා ඇත. ඉදිකිරිම් වැඩ වල ප්‍රමාදයක් නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලය සහ ඉදිකිරිම් සමාගමට ඉදිකිරිම් කාර්යයන් කඩිනම් කරන මෙන් උපදෙස් ලබා දි ඇත. |
| (ඇ) රජයේ විශ්වවිද්‍යාල වෙත ඇතුළත්වීමට සුදුසුකම් නොලැබූ ශිෂ්‍යයන් 5000 කට උපාධි පාඨමාලා හැදෑරීම සඳහා 2017 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල 08 ක උපාධි පාඨමාලා 38 ක ණය පහසුකම් සැලසීමේ ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී මෙම ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන් 1382 දෙනෙකු ලියාපදිංචි වී තිබූ අතර එම ප්‍රමාණය ඉලක්ක ගත සිසුන්ගෙන් සියයට 27 ක අඩු ප්‍රතිශතයක් විය. | ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය පිළිබඳව මහජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම තුළින් ශිෂ්‍යයන් ඒ කෙරෙහි ආකර්ශනය කර දායකත්වය වැඩි කිරීමට අදාළ කටයුතු සිදුකළ යුතුවීම. | ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් නව ක්‍රමවේදයකට අනුව සැලසුම් කළ උසස් අධ්‍යාපන යෝජනා ක්‍රමයක් වීම, ණය ලබා ගැනීමට සිසුන්ගේ හා දෙමාපියන් තුළ වූ අවිනිශ්චිතභාවය හා ණය ගෙවීම් පිළිබඳ ඇති වූ අවිශ්වාසය, ණය යෝජනා ක්‍රමයේ ස්ථිරත්වය හා දීර්ඝකාලීන පැවැත්ම පිළිබඳ විශ්වාසය තහවුරු නොවීම, පෞද්ගලික අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යාපනය හැදෑරීමේදී තත්ව ආරක්ෂණය හා පිළිගැනීම පිළිබඳ වූ අනියත බිය, ජනතාව අතරට යන වේගයේ මන්දගාමීත්වය වැනි කරුණු හේතුවෙන් මෙම වැඩ පිළිවෙලට ක්‍රියාත්මක පළමු අවස්ථාව සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 268 ක් වී තිබුණි. 2018 වර්ෂයේදී |

ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 1289 ක් විය.

### 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රවාහන සම්න්ධතා හා වත්කම් කළමනාකරණය ව්‍යාපෘතියෙහි මූලික හරයන් හා විෂයපථය වෙනස් කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා දරන ලද රු.මිලියන.91.23 ක් නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | ව්‍යාපෘති සැලසුම් කිරීම කළමනාකරණය සඳහා වියදම් දැරීමට පෙර අදාල ව්‍යාපෘති ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ඇති බාධක පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කල යුතු වීම. | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. |

### 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයුර්වේද පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය ස්ථාපිත කිරීමේ අරමුණ ඇතිව 2017 වර්ෂයේ අයවැය යෝජනාව අනුව පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් රු.මිලියන 250 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද එම ප්‍රතිපාදන තුළින් රු.මිලියන 247 ක් උපයෝජනය කර නොතිබුණි. එසේ තිබියදී සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික ඇස්තමේන්තු හා පරිපූරක ඇස්තමේන්තු යටතේ රු.මිලියන 92 ක් වෙන් කරවා ගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් උපයෝජනය නොකර ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘති කටයුතු ආරම්භ කළ යුතුය. වාර්ෂික ඇස්තමේන්තු මඟින් සලසා ගන්නා ලද ප්‍රතිපාදන උපයෝජනය කර තවදුරටත් අවශ්‍යවන ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන පරිපූරක ප්‍රතිපාදන වෙන් කර ගත යුතුවීම. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයට අධ්‍යක්ෂකවරයකු හා කාර්ය මණ්ඩලය පත් කළ යුතු වූ අතර කාර්ය මණ්ඩල අනුමැතිය 2017 මැයි 16 දින කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා යවා ඇති අතර අනුමැතිය 2018 සැප්තැම්බර් 26 දින ලැබීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂකවරයකු පත් කරනු ලැබුවේ 2019 පෙබරවාරි 05 දිනදීය. එදින සිට වෙන් කර ඇති මුදල් ක්‍රමවත් ලෙස වැය කිරීම ආරම්භ කර තිබේ. |

## 3.5 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රජයේ හා ඉන්දීය රජයේ අරමුදල් යටතේ සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 218 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ මඩකලපුව ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය ගිවිසුම් අත්සන් කිරීම ප්‍රමාදවීම හා ව්‍යාපෘති යෝජනාව නැවත වෙනස් කිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩ කටයුතු සමාලෝචිත වර්ෂය තුළ නියමිත දිනට ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | ව්‍යාපෘති යෝජනාව නිශ්චිතව හඳුනා ගැනීම හා ශක්‍යතා අධ්‍යයනය කර ඒ මත ව්‍යාපෘති සැලසුම් සකස් කළ යුතු අතර ඊට අනුකූලව ප්‍රතිපාදන වෙන් කරවා ගෙන ව්‍යාපෘති කාලරාමුව තුල කටයුතු කළ යුතු වීම. | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය විසින් ව්‍යාපෘතියේ විෂය පථය (Scope) වෙනස් කිරීමට අදාළව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2018 අප්‍රේල් 23 දිනත් අමාත්‍ය මණ්ඩල තීරණය 2018 අගෝස්තු 01 දිනත් ලැබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රු. මිලි. 275 ක මූල්‍ය ප්‍රදාන ලබා ගැනීම පිණිස අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කලද එකඟතාවයක් නොමැතිවීම මත එය සිදු නොවුණි. අමාත්‍යාංශ ව්‍යුහයෙහි සිදු වූ වෙනස්කම්ද හේතුවෙන් මෙම එකඟතා ගිවිසුම් අත්සන් කිරීමේදී ප්‍රමාදයන් සිදුවුණි. වර්තමානයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකු පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |

## 3.6 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන උසස් අධ්‍යාපනය පුළුල් කිරීමේ සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය 2017 වර්ෂයේ ආරම්භ කර 2023 දී නිම කළ යුතු විය. එසේ වුවත් සමාලෝචිත වර්ෂයේදි මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන | විදේශ ණය, ආධාර හෝ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ආරම්භ කර ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති කාලරාමුව තුළ නිම කරවා | ව්‍යාපෘතිය 2017 වසරේ ආරම්භ වුවද ව්‍යාපෘති අධ්‍යක්ෂ පත්කිරීම අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2017 වසරේ දෙසැම්බර් මස සිදුකරන ලදි. ඉන් පසු 2018 වර්ෂයේ පළමු කාර්තුව පුරාම ප්‍රධාන තනතුරු පත්කිරීම් සහ ගොඩනැගිල්ලක් කුලී පදනම මත |

| | | | |
|---|---|---|---|
| | 714.21 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද වර්ෂය අවසානයේ දී ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 5ක් වැනි ඉතා පහළ මට්ටමක පැවතුණි. | ගැනීමට කටයුතු කළ යුතුවීම. | තෝරා ගැනීම නිසා ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම වසර මැද දක්වා දීර්ඝ විය. මෙකී හේතුවෙන් වසර තුලදී සැලසුම් කල මුදල් වැය වන කටයුතු පමා විය. කෙසේ වුවද පර්යේෂණ කටයුතු, පශ්චාත් උපාධි කටයුතු සඳහා තෝරා ගැනීමේ මූලික කටයුතු සැලසුම් කල පරිදි අවසන් කිරීමට හැකි විය. |
| (ආ) | 2018 වර්ෂයේදී රු.මිලියන 280 ක් වූ ඇස්තමේන්තු ප්‍රතිපාදනය මත ශ්‍රී ලංකා රජයේ හා සෞදි රජයේ ආධාර ඇතිව ක්‍රියාත්මක වන වයඹ විශ්වවිද්‍යාලීය නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි හා ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.මිලියන 1,450 ක් වූ ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන කැලණිය, සබරගමුව, රජරට, කොළඹ යන විශ්වවිද්‍යාල සඳහා තාක්ෂණ සම්පත් සංවර්ධන වැඩසටහන සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල ඉංජිනේරු පීඨය ආරම්භ කිරීම යන ව්‍යාපෘති 02 හි භෞතික ප්‍රගතිය සියයට 02 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | විදේශ ණය, ආධාර හෝ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ආරම්භ කර ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති කාලරාමුව තුළ නිමකිරීමට කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයේ මැයි මාසය වන විට වයඹ විශ්ව විද්‍යාලයේ නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයකු පත්කර ගන්නා ලද අතර අනෙකුත් අත්‍යවශ්‍ය නිලධාරී මණ්ඩලය හා ව්‍යාපෘති කාර්යාලය පිහිටුවීමද 2018 වර්ෂයේදී සිදු කරන ලදී. ව්‍යාපෘතිය සඳහා උපදේශකවරුන් පත් කිරීම සඳහා වන ක්‍රියාවලිය අමාත්‍යාංශයත් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයත් විසින් 2018 වර්ෂයේදී ආරම්භ කර සෞදි අරමුදලේ අනුමැතිය ලබා 2019 වර්ෂය වන විට අවසන් අදියරට පැමිණ ඇත. |
| (ඇ) | 2014 වර්ෂයේදී ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසානයේදී වැඩ නිම කිරීමට නියමිතව තිබූ රු.මිලියන 39.22ක් වූ නොරාඩ් ආධාර යටතේ ක්‍රියාත්මක වන ජල කළමනාකරණ හා දේශගුණ වෙනස්කම් සඳහා අනුවර්තනය වීමේ ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙළින් සියයට 70 ක් හා සියයට 73 ක් විය. | විදේශ ණය, ආධාර හෝ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ආරම්භ කර ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති කාලරාමුව තුළ නිමකිරීමට කටයුතු කළ යුතු වීම. | විදේශ ආධාර යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය පර්යේෂණ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියට 2018 වර්ෂයේදී වෙන් කල රු.මිලියන 39.22ක මූල්‍ය ප්‍රතිපාදන 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා වියදම් කර ඇත. මූල්‍ය ප්‍රගතිය 100% කි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය මඟින් එහි අධ්‍යයන කාර්ය මණ්ඩල අධීක්ෂණය යටතේ කරන ව්‍යාපෘතියක් බැවින් ප්‍රගතිය පිළිබඳව විමසා කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් නිකුත් කිරීමට පියවර ගනිමි. |
| (ඈ) | 2016 වර්ෂයේදී ආරම්භ කර 2018 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබූ ශ්‍රී ලංකා රජයේ හා ඔස්ට්‍රියා රජයේ ආධාර ඇතිව ක්‍රියාත්මක වන මනා සෞඛ්‍ය හා පෝෂණය තුලින් නව යොවුන් වියේ දරුවන්ගේ හෘද පරිවෘත්තිය අවධානම අවම කිරීමේ | විදේශ ණය, ආධාර හෝ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ආරම්භ කර ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති කාලරාමුව තුළ නිමකිරීමට | මෙම ව්‍යාපාතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය 27.9 කි. ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දී වෙන් කර ඇති ප්‍රතිපාදනය රු.මි.5.08 කි. 2018 දෙසැම්බර් 31 දිනට විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම සහ ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සඳහා රු.මිලි. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 27.9 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානයේදී භෞතික ප්‍රගතිය සියයට 25 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | කටයුතු කළ යුතු වීම. | 4.21 ක් වියදම් දරා ඇත. භෞතික ප්‍රගතිය අවම වීම පිළිබඳව අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කර ඉදිරි පියවර ගැනීමට නියමිතය. |
| (ඉ) | දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය යටතේ ජාතික හා පළාත් මාර්ග 30 කට අදාලව කි.මී.250 ක් සංවර්ධනය සඳහා මූලික ඇස්තමේන්තු සකස් කර තිබුණද මාර්ග 03 කට අදාලව කි.මී.24 ක් පමණක් සංවර්ධන සඳහා තෝරාගෙන තිබුණි. | මූලික සැලසුම් සකස්කිරීමේදී ශක්‍යතා අධ්‍යයනයන් සිදුකර ඒ පිළිබඳ අවධානය යොමු කල යුතු අතර තාත්වික සැලසුම් සකස්කිරීමට කටයුතු කළ යුතු වීම. | තෝරා ගත් මාර්ග සියල්ල පටු මාවත් මෙන්ම ඉඩම් අත්පත් කර ගැනීමද අවශ්‍ය වූ අතර මේ නිසා ක්‍රියාත්මක කිරීම් ප්‍රමාද විය. තවද ඉඩම් අත්පත් කර ගැනීමේ දී ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම නිසා ප්‍රගතිය මන්දගාමී වී ඇත. |
| (ඊ) | මධ්‍යම අධිවේගී මාර්ගයේ ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම පිණිස ඕස්ට්‍රේලියානු සමාගමක් වෙත රු. මිලියන 1,759 ක් ගෙවා තිබියදී එම කාර්යය එකී සමාගමෙන් ඉටුකරවා නොගෙන දේශීය ආයතන කිහිපයක් සමඟ රු.මිලියන 97 ක ගිවිසුම්වලට එළඹ තිබුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමේදී ලබාගන්නා ශක්‍යතා අධ්‍යයන වාර්තාවන් තුළින් අවශ්‍ය සියළුම කරුණු අනාවරණය වන්නේ දැයි අවධානය යොමු යුතු වීම. | 2014 දෙසැම්බර් 31 දින වන විට SMFC ආයතනයට ගෙවා තිබූ මුළු මුදල රු. මිලියන 1,600කි. ඒ වන විට SMFC ආයතනය සම්පූර්ණ ශක්‍යතා අධ්‍යයනය නිම කර තිබූ අතර එම වාර්තා ව්‍යාපෘති කාර්යාලය වෙත ලබා දී තිබුණි. 2015 දී නැවත උතුරු අධිවේගී මාර්ගය ආරම්භ කරන ස්ථානයේ හා මාර්ග පථයේ පළමු කි.මී.10 පමණ කොටස වෙනස් කිරීමට රජය තීරණය කල නිසා SMFC ආයතනය කර තිබූ ශක්‍යතා අධ්‍යයනයට යම් සංශෝධනයක් කල යුතු විය.<br>ඒ අනුව ආර්ථිකමය ශක්‍යතා අධ්‍යයනය සංශෝධනය කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය සමඟත්, ප්‍රතිස්ථාපන ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම සඳහා මහාචාර්ය කේ.කරුණාතිලක මහතා සමඟත් ගිවිසුම් අත්සන් කරන ලදී. |
| (උ) | මධ්‍යම අධිවේගී මාර්ගයේ පොතුහැර සිට ගලගෙදර දක්වා කොටස වෙනුවෙන් 2017 වර්ෂයේදී කොන්ත්‍රාත්කරු හා උපදේශක සමාගම තෝරාගෙන තිබූ නමුත් කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් තැබීමට හෝ ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. නමුත් ඉඩම් පවරා ගැනීම වෙනුවෙන් හා ව්‍යාපෘති කළමනාකරණය වෙනුවෙන් දේශීයව | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට මත්තෙන් ඒ සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට ඇති හැකියාව තහවුරු කර ගත යුතු වීම. | 2017 වසරේදී කොන්ත්‍රාත් සමාගමක් හා උපදේශන සමාගමක් තෝරා ගන්නා ලද අතර ඒ සඳහා කැබිනට් අනුමැතිය හිමි විය. කෙසේ නමුත් මේ වන තෙක් එම කොටස සඳහා ණය ගිවිසුම අත්සන් කර නොමැති බැවින් ඉහත තෝරාගත් උපදේශන සමාගමට හා කොන්ත්‍රාත් සමාගමට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සිදු කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| | දරා තිබූ මුදල පිළිවෙලින් රු.මිලියන 3,200 ක් හා රු.මිලියන 1,931 ක් විය. ව්‍යාපෘතිය ආරම්භ කිරීමකින් තොරව ව්‍යාපෘති කාර්යමණ්ඩලය බඳවාගැනීම, නඩත්තුව හා වාහන භාවිතය සඳහා කළමනාකරණය වියදම් දරා තිබුණි. | | |
| (ඌ) | ඒකාබද්ධ මාර්ග ආයෝජන ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රකාශන තුල ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ වූ ලැබීම් රු.මිලියන 12,419.59 ක් හා රජයේ දායක මුදල් ලැබීම් රු.මිලියන 92.65 ක් ලෙස දක්වා තිබුණි. එසේවුවද, භාණ්ඩාගාර සටහන් අනුව එකී ලැබීම් පිළිවෙලින් රු.මිලියන 10,823.16 ක් හා රු.මිලියන 91.80 ක් වූයෙන් මූල්‍ය ප්‍රකාශ තුල ලැබීම් හා භාණ්ඩාගාර සටහන් ලැබීම් අතර රු.මිලියන 1,597.27 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනවල අදාල ශේෂයන්, භාණ්ඩාගාරයේ වාර්තාවල ශේෂයන් කාලීනව සැසඳිය යුතු වීම. | 2018 වර්ෂයේ දෙසැම්බර් මස ආසියානු සංවර්ධන බැංකුව විසින් ඉහත ණය ගිණුම් යටතේ මුදා හැර ඇති රු.මිලියන 1,596.43 ක ණය නිදහස් කිරීම් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට වාර්තා කර ඇත්තේ ගිණුම් වාර්තා භාර ගන්නා අවසාන දිනය පසු වී බැවින් එකී මුදල් භාණ්ඩාගාරය විසින් 2018 වර්ෂයේදී ගිණුම් ගත නොකර ඇති අතර මෙම රු. මිලියන 1,596.43 , 2019 වර්ෂය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් ගිණුම් ගත කර ඇත.<br>දේශීය අරමුදල් ලෙස මාර්ග ආයෝජන ව්‍යාපාතිය රු. මි.92.65 ගිණුම් ගත කර ඇති අතර භාණ්ඩාගාරයේ අනුමැතිය යටතේ අදායමින් ආපසු ගෙවූ මුදල රු.මි.0.85 ක් අඩුකර වියදම වාර්තා කර ඇත. |
| (එ) | කොන්ත්‍රාත්කරුවන් වෙත අත්තිකාරම් ලබාදීමේදී ඒ හා සමාන අගයක අත්තිකාරම් ඇපකරයක් ලබාගත යුතුයි. එසේ වුවත් ඒකාබද්ධ මාර්ග ආයෝජන ව්‍යාපෘතිය මඟින් කෑගල්ල දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 334.49 ක අත්තිකාරම් ලබාදීමේදී අත්තිකාරම් සුරැකුම්පත් ලබාගෙන තිබුණේ රු.මිලියන 304.23 ක් පමණක් වීම හේතුවෙන් රජයේ අරමුදල් අවදානමකට ලක් කර තිබුණි. | අත්තිකාරම් සම්පූර්ණයෙන්ම ආවරණය කිරීම සඳහා ඇපකර ලබාගැනීමට කටයුතු කල යුතු වීම. | කෑගල්ල දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන කොන්ත්‍රාත්කරුගේ අත්තිකාරම් සුරකුම්පත් වලින් මේ දක්වා අයකර ගන්නා ලද මුදල් අඩුකර සුරකුම් පත්වල වටිනාකම අඩු කිරීමේදී අතපසු වීමෙන් රු.මි.30.25 ක් වැඩිපුර අඩු වී ඇති අතර ඒ මුදල් අයකර ගැනීමට කටයුතු කරගෙන යනු ලබයි. |
| (ඒ) | ඒකාබද්ධ මාර්ග ආයෝජන ව්‍යාපෘතියෙහි සේවය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව රු. 65,000 ක මාසික දීමනාවක් යටතේ උපදේශකවරුන් 08 දෙනෙකු පත් කර ශ්‍රී ලංකා රජයේ | නිසි අධිකාරියක් සහිතව බඳවා ගැනීම් කල යුතු වීම. | මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකාරීත්වයේ එකඟතාවය මත එසේ උපදේශකවරුන් පත් කර තිබූ අතර දැනට මෙම නිලධාරින්ගේ සේවය අවසාන කර ඇත. |

දායකත්වය මත ව්‍යාපෘතියට ලැබෙන මුදලින් රු.4,715,395 ක දීමනාවක් ගෙවා තිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

-------------------------------

පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය සතුව පවතින දේපල පිරියත හා උපකරණ වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛන හා පරිගණක වත්කම් උපලේඛන පවත්වාගෙන ගොස් නොතිබූ අතර, සිගාස් පරිගණක පද්ධතිය තුල ඇතුලත් කර තිබූ දේපල පිරියත උපකරණ සඳහා පද්ධතිය මඟින් ලබාදෙන වත්කම් සංකේත අංකය භෞතිකව වත්කම තුළ සංකේත කර නොතිබුණි. | දේපල පිරියත උපකරණ සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට ක්‍රියා කල යුතුය. | සිගාස් වැඩසටහන තුල වත්කම් මොඩියුලයක් සකස් කර ඇති බැවින් ස්ථාවර වත්කම් ලේඛණය තවදුරටත් පවත්වා ගෙන යාම අනිවාර්ය නොවන බව සඳහන් කර ඇති නමුත් විස්තරාත්මකව තොරතුරු ඇතුලත් කල හැකි බැවින් ස්ථාවර වත්කම් ලේඛණය නැවත යාවත්කාලීන කරමින් පවතී. සිගාස් පරිගණක පද්ධතිය තුල ඇතුළත් කර ඇති දේපල පිරියත හා උපකරණ සඳහා පද්ධතිය මඟින් ලබා දෙන වත්කම් සංකේත අංකය භෞතිකව අමාත්‍යාංශය සතු වත්කම් තුළ සංකේත කර නොතිබුණ බව පිළිගන්නා අතර එම සංකේත අංක වත්කම් තුළ භෞතිකව ඇලවීමට මේ වන විට කටයුතු යොදා ඇත. |

**3.8 අනාර්ථික ගනුදෙනු**

**------------------------**

පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **--------------------** | **--------------** | **------------------------------** |
| අමාත්‍යාංශය විසින් අනුමත වැය ශීර්ෂයන්හි ඇතුළත්ව නොතිබූ කාර්යයක් වන මහනැගුම ව්‍යාපෘතියේ සුපරීක්ෂණය සඳහා භූගෝලීය තොරතුරු පද්ධතියක් (GIS) ස්ථාපනය සඳහා 2014 වර්ෂයේ රු.මිලියන 34.695 ක් වැය කර තිබුණි. නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘතිය ආරම්භ කිරීම හේතුවෙන් 2015 වර්ෂයේ දී අතහැර දමා තිබුණි. තවද, 2018 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 20.29 ක් වැයකර තිබූ අතර රු.මිලියන 14.4 ක් තවදුරටත් ගෙවිය යුතුව තිබුණි. අදාළ කොන්ත්‍රාත්තුව ඵලදායී ලෙස භාවිත කළ හැකි පරිදි සම්පූර්ණ කර නොතිබියදී පංච පුද්ගල කමිටු නිර්දේශය මත ගෙවීම් කිරීමට එකඟවීම සම්බන්ධයෙන් හේතුවූ කරුණු විගණනයට පැහැදිලි නොවුණි. | මුදල් රෙගුලාසි 136(1) ප්‍රකාරව කොන්ත්‍රාත්තුගත කාර්යයක් සඳහා අපේක්ෂිත භාවිතයට ගත හැකි තත්ත්වයට හෝ අපේක්ෂිත ප්‍රතිඵලයන් ලබාකර ගෙන ඇත්නම් පමණක් ගෙවීම් කළ යුතු වීම. | 2014 වර්ෂයේදී ග්‍රීන් ටෙක් කන්සල්ටන්සි ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය සමඟ නෛතික වශයෙන් ගිවිසුම් ගත වී ඇති බැවින් එම ගිවිසුම් වල නීත්‍යානුකූල තත්ත්වය සහ මෙම GIS දත්ත පද්ධතියෙහි අවශ්‍යතාව පිළිබඳ සැලකිල්ලට ගෙන ඉහත දත්ත පද්ධතිය සඳහා ඉදිරිපත් වූ බිල්පත් සම්බන්ධව පත් කරන ලද කමිටුව මගින් ගෙවීම් නිර්දේශ කර ඇත. |

## 3.9 කළමනාකරණ දූර්වලතා

පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017, 2018 හා 2019 වර්ෂයන්හිදී දරන ලද රක්ෂණ වියදම් පිළිවෙලින් රු.2,011,307, රු.2,313,440 හා රු.1,747,283 ක් අමාත්‍යාංශයේ වාහන පූර්ණ රක්ෂණ කිරීම සඳහා ගෙවා තිබුණද රක්ෂණ ආවරණයන් තුළින් ආපදාවන් අළුත්වැඩියා කර වන්දි ප්‍රතිපූර්ණය කරවා ගැනීමට කළමනාකරණය අපොහොසත්වී තිබුණි. | රක්ෂණ පිරිවැය හා සබැඳිව අනතුරු සම්බන්ධ අළුත්වැඩියාවන් සිදුකර ගත යුතුවේ නම් අදාළ පිරිවැය දරන කාලයේදී හා එකී රක්ෂණ ආවරණයන් තුළින් අදාළ අළුත්වැඩියාවන් සිදුකරවා ගැනීම කළමනාකරණය කටයුතු කළ යුතු වීම. | 2017, 2018 හා 2019 වර්ෂයන්ට අදාළව වාහන රක්ෂණය වෙනුවෙන් යොදවන ලද මුදල් නිෂ්කාර්ය වියදමක් නොවන බවත් වාහන රක්ෂණය කිරීම අනිවාර්ය කාර්යයක් බවත් කාරුණිකව දන්වා සිටිමි. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 ඡේදයේ 4.3 වන උපවගන්තියට අනුව අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරන ලද සියළුම විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවත් අමාත්‍යාංශයේ උක්ත පනතේ නියමයන් අනුව කටයුතු කර නොතිබුණි. | ජාතික විගණන පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කල යුතු වීම. | ජාතික විගණන පනත නිකුත් කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කරන ලද විගණන වාර්තා වලින්, වාර්තා 02 ක් හැර අනෙක් සියළුම වාර්තාවල පිටපත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. |
| (ආ)අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය විසින් 2018 වර්ෂයට අදාලව සකස් කර තිබූ විගණන සැලැස්ම තුළ ඇතුළත් කර තිබූ විගණන පැවරුම් සංඛ්‍යාව 27 ක් වුවත් වර්ෂය තුළ නිමකර තිබූ පැවරුම් සංඛ්‍යාව 11 ක් | අභ්‍යන්තර විගණන සැලැස්ම අමාත්‍යාංශයට ඵලදායි අන්දමින් ක්‍රියාවේ නැංවීමට කටයුතු කළ යුතු වීම. | **2018 වාර්ෂික විගණන සැලැස්මෙහි** විගණන පැවරුම් 27 ක් අන්තර්ගත වුව ද එයින් නිම කර තිබූ සංඛ්‍යාව 11 කි. 2018 වර්ෂය තුළදි ව්‍යාපෘති 11 ක් සඳහා ව්‍යාපෘති අභ්‍යන්තර විගණකවරුන් පත් කරන ලද අතර එම ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණන |

| | | |
|---|---|---|
| විය. ඒ අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් සැලසුම් කල කාර්යසාධන මට්ටම ළඟාකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | | කටයුතු ඔවුන්ගේ විගණන සැලසුම් මත සිදු කිරීමට උපදෙස් ලබා දී ඇත. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මහා මාර්ග අංශය | | |
| **(i)** ද්විතීක මට්ටමේ පුරප්පාඩු 51 ක් පවතින බැව් දක්වා තිබූ නමුත්, අමාත්‍යාංශය වෙත බඳවාගෙන ඇති ද්විතීක මට්ටම සංවර්ධන නිළධාරීන් ගණන 158 දෙනෙකි. එසේ වුවද, මෙම නිලධාරින් අමාත්‍යාංශයට අදාළ කාර්යභාරය සඳහා ඍජු සම්බන්ධතාවයක් නොදක්වා මාර්ග සංවර්ධන අධිකාරියෙහි රාජකාරී වෙනුවෙන් නිදහස් කර අමාත්‍යාංශය මඟින් වැටුප්, දීමනා ගෙවීම් කර තිබුණි. මේ අනුව ද්විතීක මට්ටම සඳහා අනුමත කාර්යමණ්ඩලයෙන් සැබෑ පුරප්පාඩුවක් නොපවතින බව හා නිසි ඇගයීමකින් හා සේවා අවශ්‍යතා නිර්දේශ ගැලපීමකින් තොරව කාර්යමණ්ඩල අවශ්‍යතා වැඩිකර ගැනීමට කටයුතු කර තිබුණි. | අමාත්‍යාංශයේ සැබෑ සේවක අවශ්‍යතාවය නිරූපණය වන පරිදි අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට හා ඊට අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත මෙම අමාත්‍යාංශයට උපාධිධාරීන් බඳවා ගෙන ඇති අතර අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය අධි පුනර්කථනයක් සිදු කර නොමැති අතර රජයේ ප්‍රතිපත්තිමය තීරණ අනුව කටයුතු කිරීමෙදි කාලීනව සිදුවන වෙනස්කම් මත නිලධාරීන් අතිරික්ත වීමක් සිදු වී ඇත. |
| **(ii)** ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සංඛ්‍යාව 12 ක් වන නමුත්, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාථමික මට්ටමේ සේවයෙන් 14 දෙනෙකු අමාත්‍යාංශ රාජකාරී සඳහා නිදහස් කර තිබිණි. එම හේතුවෙන් තෘතීක මට්ටමේ සැබෑ පුරප්පාඩු නොපවතින බැව් නිරීක්ෂණය විය. | අමාත්‍යාංශයේ සැබෑ සේවක අවශ්‍යතාවය නිරූපණය වන පරිදි අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කරගැනීමට හා ඊට අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් මෙම තනතුරු වල පුරප්පාඩු සඳහා සේවකයන් අනුයුක්ත කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර එම පුරප්පාඩු තනතුරු සඳහා සේවකයන් අනුයුක්ත කිරීමේදී ඊට සමානුපාතිකව අධිකාරිය වෙත සේවකයන් නිදහස් කිරීමට කටයුතු කර ඇත. |

**(ආ)** උසස් අධ්‍යාපන අංශය

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වනවිට කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 79 ක් වූ අතර එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය විසින් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය අවස්ථා කිහිපයකදී දැනුවත් කර තිබුණ ද 2019 අප්‍රේල් මාසය අවසන් වනවිටත් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | කාර්යමණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කර අමාත්‍යාංශයේ කටයුතු කාර්යක්ෂමව හා කාලීනව කර යාමට කටයුතු කළ යුතුවීම. | සමාලෝචිත වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශයේ සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 79 ක් වූ අතර එම පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය විසින් පියවරයන් ගෙන ඇත. |